# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2428/12 - 2025 මාර්තු මස 19 වැනි බදාදා - 2025.03.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මා විසින්, 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත යටතේ පිහිටුවන ලද අංක 78, ගාලු පාර, කොළඹ 03 යන ලිපිනයෙහි පිහිටා ඇති ''ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ'' ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, උසස් අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා මෙහි II වන උපලේඛනයේ II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති කෙටි යෙදුමට අනුරූපීව මෙහි II වන උපලේඛනයේ I වන තීරයේ දක්වා ඇති උපාධිය ප්‍රදානය කිරීම සඳහා යොමු කරන්නා වූ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් ''ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ'' ආයතනය මෙම නියමය මගින් පිළිගනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. (මෙහි මින් මතු ''ආයතනය '' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, අවම අධ්‍යයන සම්භාර 120 ක් සහිත (එස්. එල්. කියු. එෆ්. 6 වන ස්ථරයේ) හෝටල් සහ නිවාඩු නිකේතන කළමනාකරණවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන්,

   (අ). ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී කවර හෝ විෂයය ධාරාවකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (03) ක් එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම;

   යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

2. ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධියට සම්බන්ධ උපාධි පාඨමාලාව අංක 78, ගාලු පාර, කොළඹ 03 යන ස්ථානයේ පමණක් පැවැත්විය යුතු ය.

1A - PG 7056 - 284 (2025/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. ආයතනය විසින්, මෙම නියමය ප්‍රකාශයට පත්කළ දිනයේ සිට සෑම වසර පහකට (5) වරක් නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන සමාලෝචනයට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමිය යුතු ය.

**II වන උපලේඛනය**

| *I වැනි තීරය*<br>*උපාධිය* | *II වැනි තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| හෝටල් සහ නිවාඩු නිකේතන කළමනාකරණ ගෞරව | බීඑච්ආර්එම් (ගෞරව) |

ආචාර්ය **හරිනි අමරසූරිය**,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය.

2025 මාර්තු මස 12 වැනි දින,
කොළඹ දී ය.

EOG 03 - 0171

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.